

# දෙවියන්වහන්සේ හඳුනාගැනීම

## - බයිබලය එළිදරව් කරන දේ -

## (Getting to know God)

# දෙවියන්වහන්සේ හඳුනාගැනීම
# -බයිබලය එළිදරව් කරන දේ-

කලින් කලට, තමන් දෙවියන්වහන්සේ අදහන්නේදැයි අසමින් මිනිසුන් අතර සමීක්ෂණ සිදුකෙරෙයි. විස්මිතව, 60%ක් පමණ එසේ යැයි පිළිගත්තද, ඔවුන් අතුරින් සිද්ධස්ථානයක් කරා නිරන්තරයෙන් යන්නේ 10%ක් පමණය. නමුත් එම සමීක්ෂණය ඉදිරියට ගොස්, මෙම දෙවියන් අදහන්නන්ගෙන් තමන් දෙවියන් ගැන අදහන්නේ කුමක්ද යන්න ඇසුවහොත්, ඇදහිය නොහැකි අනිශ්චිතයක් මතුවෙයි.

ඔවුන් තුළ ඇති දෙවියන්වහන්සේ කෙරෙහි දෘෂ්ටිය, තමන් තුළ තමන් කෙරෙහි ඇති දෘෂ්ටිය පිළිඹිබු කරයි. බොහෝ අය තම අසමත්කම් කෙරෙහි ආසක්තවීමට පෙළඹෙන අතර, දෙවියන්වහන්සේද නොවැලැක්විය හැකි ලෙස එසේම බැව් සිතත්. "දෙවියන්වහන්සේ මෙසේයැයි සිතීමට මම කැමැත්තෙමි"යි පවසන ඔවුන්, උන්වහන්සේ "අනන්ත ලෙස දයාවන්ත, සැමවිටම සමාව දෙන, වැරදිකරුවන් හෝ විනිශ්චයට පත් නොකරන" ලෙස සිතත්. තවත් සමහරු, "දෙවියන්වහන්සේ සිටී නම් සහ මට සිතෙන ලෙස නිවරදිදේ මා කරත් නම්, ලැබිය යුතු කුමන දීමනාවක් හෝ මට ලැබේ"යැයි සිතති. ලෝකයේ බටහිර කොටස තුළ වර්තමානයේ සියලු ආගම් එක ලෙසම සත්‍යයැයි පිළිගන්නා නිසා, දෙවියන්වහන්සේ දෙසට ඕනෑම ප්‍රවේශයක් එකලෙසට යහපත් බැව් සිතත්.

සත්‍ය කරුණ නම්, නූතන මිනිසා බොහෝ සෙයින් මිත්‍යාදෘෂ්ටිකය. ඇදහිල්ලේ කිසිම පදනමක් නොමැති කමින්, දෙවියන්වහන්සේගේ අධිකාරිත්වයේ කිසිම සංවේදීතාවයක් ඔහුට නොමැත. තමාගේම පරිකල්පන තුළ අතරමංව ඇති ඔහු සියලු පරිඥානයෙන් තොරය; ඔහු ව්‍යාකුලතාවයෙන් යුතුය, උදාසීනය.

## පදනම කොහිද?

කිසිම ආගමක් හෝ, මනුෂ්‍යවර්ගයා මත කිසියම් බලයක් සහ අධිකාරියක් පවත්වන්නට නම්, එය දෙවියන්වහන්සේ විසින්ම එළිදරව්කල යුතුය යන්න ස්වයං ප්‍රත්‍යක්ෂ දෙයකි. ඇත්තේ එකම විකල්පයකි: පණිවිඩය දෙවියන්වහන්සේගෙන් නොවේ නම්, එය පැමිණිය යුත්තේ මනුෂ්‍යයාගෙනි. නමුත් කිසිම මිනිසෙකු සත්‍යය සහ නිවැරදි දේ,

අනෙක් මිනිසුන්ට සහ ගැහැණුන් හට ප්‍රකාශකිරීමට අනුමාන කරන්නේ කෙසේද?

ලෝකයේ ආගම් මහත් බහුතරයේ ඉගැන්වීම් පැහැදිළිවම පැමිණියේ මිනිස් කල්පනාවෙනි. එක් විශිෂ්ට ව්‍යාතිරේකයක් ඇත. බයිබලයේ ආගම-මෙම පොත්පිංච සැලකිලිමත්වන ක්‍රිස්තියානි ආගම-අවධාරනාත්මකව එළිදරව්වූ ආගමකි, මිනිසා සඳහා දෙවියන්වහන්සේගේ වචනයයි. එහි පණිවිඩය මිනිස් අධිකාරියක් ලෙස කිසිවිටෙක ඉදිරිපත්කර නොමැත. "දෙවියන්වහන්සේගේ වචනය" දිවැස්වරයාට පැමිණෙන අතර ඔහු එය එලෙසම බෙදා දෙයි. පැරණි සහ නව ගිවිසුම් මෙසේ සමානය.

අනාගත පරම්පරාවේ සුභසාධනය සඳහා වචනය ලියා තබන විට, එය "දෙවියන්වහන්සේගේ අනුභාවයෙන්" බැව් පාවුල් පවසයි. "දේවානුභාවයෙන්" බැව් ඔහු ප්‍රායෝගිකව ලිව්වේය (2 තිමෝති 3:16), ලියන ලද වචනවල දෙවියන්වහන්සේගේ ආත්මය (හෝ හුස්ම) තිබූ බව හැඟවීමේ අපූර්ව ප්‍රකාශනයකි. එම නිසා පේතෘස් මෙසේ පවසයි, ශුද්ධලියවිල්ල "මනුෂ්‍යයාගේ කැමැත්තෙන් කිසි කලෙක නොපැමිණියේය. නමුත් මනුෂයෝ ශුද්ධාත්මයාණන් විසින් පොළඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කතාකළෝය" (2 පේතෘස් 1: 21). වෙනස නිරීක්‍ෂණය කරන්න: "මනුෂ්‍යයාගේ කැමැත්තෙන්" නොව, නමුත් උන්වහන්සේගේ ආත්මය මගින් සෘජුවම දෙවියන්වහන්සේගෙන්.

බයිබලය, උත්කෘෂ්ඨ අධිකාරියේ පොතවන්නේ ඒ නිසාය. එය අප සඳහා දෙවියන්වහන්සේගේ වචනයයි. නමුත් වැදගත් ප්‍රතිඵලයක් පැමිණෙයි: එය එසේ නම්, අප එය පැහැර නොහැරිය යුතුය. එය ගැන ගැඹුරින් සිතිය යුතුය.

## දෙවියන්වහන්සේගේ ස්වයං එළිදරව්ව

ඉදින්, අපි බයිබලය වෙතට යමු. දෙවියන්වහන්සේ ගැන එහි අපට පැවසීමට ඇත්තේ කුමක්ද? මෙම තොරතුරු මඳ නොවේ-ඒවා බහුලය. බයිබලයේ පළමුවැනි පිටුවේ ආරම්භවන එය අන්තිම පිටුව දක්වා, එනම් පැරණි ගිවිසුමේ ව්‍යවස්ථාව, ගීතාවලිය සහ දිවැස්වරු සහ එතැන් සිට නව ගිවිසුමේ සුභාරංචි සහ ලිපි දක්වා පවත්වාගෙන යයි. නමුත් දෙවියන්වහන්සේගේ මෙම රූපිකය සංකීර්ණ හෝ වියවුල් සහගත නොවන්නේ තමන්ගේම ඒකාසන චරිතය මිනිස්වර්ගයාගේ ප්‍රගමනය සමග සමීප බැඳීමක් සහ ලෝකයේ අනාගතය ගැන සැලකිලිමත් විශිෂ්ට එක් පෞද්ගලිකත්වයක් මතුවන හෙයිනි. උන්වහන්සේ, මිනිස්

අවශ්‍යතාවයේ මායිම් දක්වා පහත් කිරීමටත්, ඇත ස්වර්ගයක "කොහේ හෝ" තල්ලුකරදමා පහසුවෙන් නොසලකාහැරීමටත් නොහැක. මිනිසුන් සහ ගැහැණුන් එසේ කරන්නේ නම්, ඔවුන් සඳහා ප්‍රතිවිපාක විනාශකාරී වනු ඇත.

දෙවියන්වහන්සේගේ ස්වභාවය අරභයා බයිබලයේ පොදුම පැහැදිළි කිරීම "සදාකාලික"ය. මෙම උදාහරණ සලකා බලන්න:

"කඳුවල උත්පත්තියටත් ඔබ විසින් පොළොව සහ ලෝකය සෑදීමටත් පළමුවෙන්, සදාකාලයෙන් සදාකාලයටම ඔබ දෙවියන්වහන්සේය. (ගීතාවලිය 90:2).

"පොළොවේ සීමාවල මැවුම්කාරවූ ස්වාමීන්වහන්සේ වන සදාකාල දෙවියන්වහන්සේ ක්ලාන්ත නොවන බවත් වෙහෙස නොවන බවත් නුඹ දන්නේ නැත්ද? උන්වහන්සේගේ ඥානය දැනගන්ට බැරිය (යෙසායා 40:28).

"ස්වාමීන්වහන්සේ සැබෑවූ දෙවියන්වහන්සේය. උන්වහන්සේ ජීවමාන දෙවියන්වහන්සේය, සදාකාල රජකෙනෙක්ය...." (යෙරමියා 10:10).

අපගේ අත්දැකීමට සම්පූර්ණයෙන් පිටස්තර පැවැත්මේගුණයක් මෙන්න. සැබවින්ම උන්වහන්සේගේ දිවැස්වරු මාර්ගයෙන් දෙවියන්වහන්සේම එසේ හගවනසේක:

"මිසරවරු දෙවියන්වහන්සේ නොව මනුෂ්‍යයන් පමණක්ය; ඔවුන්ගේ අශ්වයෝද ආත්මය නොව මාංශයය" (යෙසායා 31:3).

මෙතැන මනුෂ්‍යයෝ / මාංශය සහ දෙවියන්වහන්සේ/ ආත්මය අතර පැහැදිළි අසමාණතාවයක් ඇත. දෙවියන්වහන්සේගේ ස්වාභාවය ආත්මය වන අතර, එය එමනිසා මනසින් සීමිත වර්තයෙන් දුබල සහ මරණයෙන් අභාවයට යන මිනිස් ස්වාභාවය අතර ඒකාන්ත අසමානතාවයක් සාදයි.

## දෙවියන්වහන්සේ සදාකාලිකය

නව ගිවිසුම තුළ නිශ්චිතම විස්තරකර දීම් අපෝස්තුළුවර පාවුල්ගේය:

"ඉදින්, අමරණීයවූ, අජරාමරවූ, අදෘශ්‍යමානවූ, එකම දෙවිවූ, සදාකාල රජ්ජුරුවන්වහන්සේට ගෞරවයද තේජසද සදාකාලයටම වේවා, ආමෙන්." (1තිමෝති 1:17).

"කිසිවෙකුට ළඟාවෙන්නට බැරි ආලෝකයෙහි වසන්නාවූ, කිසි මනුෂ්‍යයෙකු විසින් නුදුටුවාවූ, දකින්ටත් බැරිවූ තැනන්වහන්සේ ඒ ප්‍රකාශවීම නියම කාලවලදී පෙන්වනවා ඇත. උන්වහන්සේට ගෞරවයත් සදාකල් පරාක්‍රමයත් වේවා. ආමෙන් (1තිමෝති6:16).

මෙම විස්තරකරවීම් තුළ දෙවියන්වහන්සේගේ ස්වභාවය ගැන පෙනෙන නිශ්චිතම හැඳින්වීම් දෙක ඍණාත්මක ලෙස ප්‍රකාශවේ. උන්වහන්සේ "අජරාමර" (ජරාමර නොවූ) සහ "අමරණීය" (මියනොයන)ය. " මිනිස් මාංශයට සෘජු ප්‍රතිවිරුද්ධ "ස්වාභාවයක්" දෙවියන්වහන්සේට ඇත්තාහ. එම නිසා උන්වහන්සේ "සදාකාලිකය", ප්‍රායෝගිකව "යුගයයන් තුළ"ය. එක් පදයක් තුළ තුන් වතාවක් මෙම වචනය පාවුල් යෙදවීම වැදගත්ය: "....සදාකාල රජ්ජුරුවන්වහන්සේට (යුගයයන් තුළ)....තේජසද සදාකාලයෙන් සදාකාලයට." දෙවියන්වහන්සේගේ සදාකාලික ස්වභාවය පිළිබඳ සිතුවිල්ලෙහි හෙතෙම කෙතරම් හැඟීමෙන් සිටින්නට ඇත්ද.

## දෙවියන්වහන්සේගේ ශ්‍රෙෂ්ඨත්වය

දෙවියන්වහන්සේගේ හුදු උත්තරීතර භාවය සහ මිනිස්වර්ගයා විසින් උන්වහන්සේ සඳහා ආරෝපණය කල යුතු ගෞරවය, ශුද්ධලියවිලි පුරා නිරන්තරවම පවත්නා තේමාවකි. ඉශ්‍රායෙල් රජුවූ දාවිත් විසින් එය මැනවින් පහදා දෙන ලදි:

"අපේ පියවූ ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්ස, ඔබට සදාකාලයටම ප්‍රශංසා වේවා. ස්වාමීන්වහන්ස, මහන්තත්වයද පරාක්‍රමයද තේජසද ජයද මහිමයද අයත් ඔබටය. මක්නිසාද ස්වර්ගයෙහිත් පොළොවෙහිත් ඇති සියල්ල ඔබගේය. රාජ්‍යයත් ස්වාමීන්වහන්ස, ඔබට අයිතිය. ඔබ සියල්ල කෙරෙහි හිස මෙන් උස්ව සිටිනසේක" (1ලේකම් 29:10,11).

මහන්තත්වය ... පරාක්‍රමය... තේජස... ජය... මහිමය... ස්වර්ගයහිත් පොළොවෙහිත්... රාජ්‍යය... හිසමෙන්... උස්ව. දෙවියන්වහන්සේගේ මහිමාන්විත උත්තර්තරභාවය ගැන දාවිත්ගේ දැඩි සවිඥානය අගය කිරීමට මෙම වදන් තුළින් සෙමෙන් කියවායැම අපට යහපත්ය. අප දුටු පරිදි, අපෝස්තුලු පාවුල් විසින් මෙය හවුල්කර ගත්තේය.

පැරණි ගිවිසුම් දවස්වල සියලුම විශ්වාසිකයන් විසින් දෙවියන්වහන්සේගේ උත්තරීතර තේජස මෙම ගැඹුරු වටහාගැනීම දරන ලදි. අප පැරණි ගිවිසුම නොසලකා නොහැරිය යුත්තේ එහි දෙවියන්වහන්සේගේ චරිතයේ පදනම්ද, නව ගිවිසුම තුළ ප්‍රසාරණය

කරන ලද සහ නිශ්චය කරන ලද උන්වහන්සේගේ පාදක සත්‍යයන්ද එළිදරව් කරන බැවිනි. තවදුරටත්, මිසරයේ සිට නික්මයාම දක්වා ඇතිවූ සසල කරවන සිද්ධීන් තුළ, මනුෂ්‍යවර්ගයාගේ අන් සියලුම දෙවිවරුන්හට එරෙහිව දෙවියන්වහන්සේගේ උත්තරීතරභාවයේ මහත් එළිදරව්ව ප්‍රදානය කලේ ඉශ්‍රායෙල්හටය. මිසරවරුන් මත පැමිණි පීඩාවල්හි ප්‍රතිපල සහ රතුමුහුද තරණය කිරීමේදී තමන්ගේම මුදවාගැනීමත් ඉශ්‍රායෙලිතයන් දැක තිබුනි. වසර 40කට පසුව මෝසෙස් එය ඉතා ආකර්ෂණීය ලෙස ඉදිරිපත්කලේය:

> "මෙයාකාර මහත් දෙයක් සිද්ධවුනාද?.. ප්‍රථම තිබුනු පසුගිය දවස්වලින් විභාගකරපන්න. ගින්න මැද සිට කථාකරන දෙවියන්වහන්සේගේ හඬ නුඹ විසින් ඇසුවාක් මෙන් වෙන යම් සෙනගක් අසා ජීවත්වුනාද? නොහොත් නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ මිසරයේදී නුඹලාගේ ඇස් ඉදිරියෙහි නුඹලා උදෙසා කල සියල්ල ලෙස වෙනයම් දෙවිකෙනෙක් ඇවිත් පරීක්ෂාවලින්ද, ලකුණුවලින්ද, පුදුමවලින්ද..." (ද්විතියකථාව 4:32-34).

තමන්වහන්සේ උදෙසා ඔවුන්ගේ සේවය සඳහා ආයාචනයේ පදනම ලෙස, ඔවුන් වෙනුවෙන් ගැළවීමේ මහත් බලය දෙවියන්වහන්සේ ප්‍රදර්ශනය කළසේක.

> "මා විසින් මිසරවරුන්ට කල දෙයද නුඹලා රාජාලීන්ගේ පියාපත් පිට උසුලා මා වෙතට ගෙනා බවද නුඹලා දුටුවහුය. දැනුදු නුඹලා සැබවින් මාගේ හඬට කීකරුව මාගේ ගිවිසුම රක්ෂා කරන්නහු නම් සියලු සෙනග අතරින් නුඹලා මට අසහාය (විශේෂ) වස්තුවක් වන්නහුය..." (නික්මයාම 19:4-5).

තමන්වහන්සේ තුළ විශ්වාසය සඳහා ආයාචනය පදනම්ව තිබුනේ උන්වහන්සේගේ සදාචාරාත්මක අනර්ඝත්වය මත නොව (පසුව මේ අරබයා උන්වහන්සේ බොහෝ සාක්ෂි දෙනු ඇත.), නමුත් එවකට පෘතුවිය මත තිබූ ශ්‍රේෂ්ඨතම මිථ්‍යාදෘෂ්ටික පද්ධතිය (මිසර) මත උන්වහන්සේගේ උත්තරීතරභාවයේ ප්‍රදර්ශනය බැව් මෙහිලා විශේෂයෙන් නිරීක්ෂණය කරන්න. ඉශ්‍රායෙල් සඳහා උන්වහන්සේගේ ව්‍යවස්ථාව මෝසෙස් තුළින් දෙවියන්වහන්සේ එළිදරව් කරන විට මෙය ශක්තිමත් වෙයි. පළමුවැනි වගන්තිය ආරම්භවන්නේ මෙසේය:
"මම වනාහි වහල්කමේ ගෙයින් එනම් මිසර දේශයෙන් තා පිටතට ගෙනාවාවූ තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේය" (නික්මයාම 20:2).

ඉන්පසු, ඔවුන් සඳහා දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවේ සාරයවූ දසපනත පැමිණෙයි.
පළමුවෙන් අධිකාරිය පැමිණෙයි; ඉන්පසු සදාචාර ගුරුකම්ය. මෙම පිළිවෙල අනවශ්‍යයයැයි කිව නොහැක. යේසුස්වහන්සේ මෙම ප්‍රතිපත්තියම තෝරාගැනීම කැපීපෙනෙන සුලුය..උන්වහන්සේ කථාකල වචන තමාගේ නොවන බවත්, නමුත් තම පියාණන්ගේ බවත් උන්වහන්සේ කීහ.
දෙවියන්වහන්සේට යාච්ඤාකිරීමේදී, ඔහු උන්වහන්සේ අමතන්නේ "ස්වර්ගයටත් පොළොවටත් ස්වාමිවූ පියාණෙනි" (මතෙව් 11:25) යනුවෙනි. උන්වහන්සේ සොයන්නාවූ සැමට දෙවියන්වහන්සේ පියාණන්වූවත්, උන්වහන්සේ "ස්වර්ගයටත් පොළොවටත් ස්වාමීන්" විය. කණගාටුවෙන් වුවද කිව යුත්තේ, තමන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන්සේ සලකාගන්නා බොහෝ අය පවා වර්තමානයේදී මෙම ප්‍රමුඛතාවයන් නොසලකා හරින බවය.

## දෙවියන්වහන්සේගේ අනුපමේයභාවය

තම ජනතාව උදෙසා දෙවියන්වහන්සේගේ සියලු මහත් ක්‍රියා පිළිබඳ විස්තරයේදී, මෝසෙස් මෙම නිගමණයට පැමිණියේය:

> "ස්වාමීන්වහන්සේම ඉහළ ස්වර්ගයෙහිත් පහල පොළොවෙහිත් දෙවියන්වහන්සේ බවද වෙන දෙවිකෙනෙක් නැති බවද අද දවසේ දැනගෙන ඒ බව නුඹේ සිතේ තබාගනින්න" (ද්වීතියකථාව 4:39).

මිත්‍යාදෘෂ්ඨික දෙවිවරු ගණනාවක් සිටිනා ලෝකයතුළ මෙය සක්‍රිය සහතිකකිරීමකි. තමන් මුදාගත් දෙවියන්වහන්සේ නිරතුරුවම අතපසු කරන ලද ඉශ්‍රායෙලයේ සියවස් ගණනාවක් තුළ එය සක්‍රියව පැවතුනි. මිසරයේ මර්දනයෙන් ඔවුන් මුදාගත්තේ තමන් යැයි උන්වහන්සේගේ නිරන්තර සිහිකිරීම් තුළ, තමන්වහන්සේ පමණක් දෙවියන්වහන්සේ බැව් උන්වහන්සේ ප්‍රකාශකරනසේක:

> "මම ස්වාමින්වහන්සේය, වෙන කෙනෙත් නැත. මා හැර වෙන දෙවිකෙනෙක් නැත" (යෙසායා 45:5).

බොහෝ ලබ්ධි සහ මිත්‍යාදෘෂ්ඨික දෙවිවරුන්ගේ පැවතීම අපෝස්තුලුවර පාවුල් නව ගිවිසුමේ හඳුනාගනී; නමුත් ක්‍රිස්තුස්වහන්සේ තුළ අදහන්නන්ට මෙම පිළිම අර්ථවිරහිතය:

"දේවතාවෙක් ලෝකයෙහි කිසිත් නැති බවත්, එකම දෙවිකෙනෙක් මිස

අන් දෙවිකෙනෙක් නැති බවත් දනිමුව... දෙවිවරුය කියන තැනැත්තන් සිටින නමුත්, අපට ඇත්තේ එක දෙවිකෙනෙක්වන පියාණන්වහන්සේය. සියල්ල පැමිණ තිබෙන්නේ උන්වහන්සේගෙන්ය... එකම ස්වාමීන්වහන්සේය, එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය" (1කොරින්ති 8:4-6).

එපීසවරුන්ට ලියන පාවුල් මෙසේ පවසයි:

> "ඇත්තේ එක ශරීරයත්, එක ආත්මයාණන්වහන්සේත්, එක ස්වාමීන්වහන්සේත්, එක ඇදහිල්ලත්, එක බෞතිස්මයත්... සියල්ලන්ට එකම පියවූ දෙවියන්වහන්සේත්ය" (4:4-6).

මෙය, "එකම දෙවියන්වහන්සේ" මත රඳන ක්‍රිස්තියානි විශ්වාසයේ විවිධ පැතිකඩවල ඒකත්වය නින්නාදකරන්නාවූ ප්‍රකාශයකි.

## නූතන ආකල්ප

අප මෙතෙක් දුර සලකාබලන ලද මහිමය, එකම දෙවියන්වහන්සේගේ තේජස, ස්වර්ගයේ සහ පෘතුවියේ මැවුකරුවාණන් යන සියල්ල හගවන්නේ උන්වහන්සේ දුබල මිනිස්වර්ගයා වෙතින් ගෞරවනීය වන්දනාව ලැබිය යුතු බවය- ඉදින් එසේ බයිබලයේ පිටු අතර සියලු විශ්වාසිකයන්ගෙන් උන්වහන්සේ එය එසේ ලබනසේක.

නමුත්, තමන් ක්‍රිස්තියානීන්යැයි කියාගන්නා අය ඇතුළුව, දෙවියන්වහන්සේ දෙස වර්තමාණයේ දක්වන ආකල්ප ගැන අප කුමක් කිවයුතුද? පළමුව, බටහිර ශිෂ්ඨාචාරය තුළ ආගමික මත, අනෙකුත් ලබ්ධි අනුගමනය කරන්නන්ගේ වැඩීම තුළින් බොහෝසේ වෙනස්වී ඇත. බොහෝ අය දරන මතයනම්, සියලුම ආගම් දෙවියන්වහන්සේ වෙතට තම අනන්‍ය මාවත සපයන අතර ඒවා සියල්ලම "වලංගු" බවයි. අපෝස්තුලුවර පාවුල් පෙන්වාදුන්, ගැළවීම සඳහා ඇති එකම මාර්ගය යන මහත් ක්‍රිස්තියානි ප්‍රකාශ ජනතාව ප්‍රතික්ෂේප කරනු ලබත්:

> "වෙන කිසිවෙකු තුළ (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හැර) ගැළවීම නැත්තේය. අපේ ගැළවීමට අවශ්‍යවූ... වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේය" (ක්‍රියා 4:12).

බයිබලයේ රූපනය කරන ලද දෙවියන්වහන්සේ, අවධානයේ මධ්‍යය කෙරෙන් මායිම් දක්වා පහත්කර තිබීම නූතන මිනිසා සඳහා පුදුමයක් නොවේ. ආගමික අභ්‍යාසයන්හිදී පවා, වේලාවකට ප්‍රකාශවන අවිධිමත්

සහ සුලභ විධි උන්වහන්සේගේ නාමයට හිමි ගෞරවය තවදුරටත් පුදනොකරන බැව් පෙන්වයි. "ආලේලූයියා" (අරුත ස්වාමීන්වහන්සේට මහිමය වේවා) නමැති ශුද්ධවූ අරුත් ඇති වචන පවා අසභ්‍ය විකටයන්ගේ පැහැදිළි අනුමැතියට අපහාසාත්මකව යොදාගනී.

මෙය සඳහා, මිනිස් මනස උත්කෘෂ්ඨකරන මානවවාදී සහ භෞතිකවාදී භාවාර්තය එකතුකල යුතු අතර, දෙවියන්වහන්සේගේ පැවැත්මටත්, උන්වහන්සේහට වන්දනාවටත් ඉඩක් නොමැත. නූතන මතය ගැන මෙම සංක්ෂිප්ත ආවර්ජනය පවා පෙන්වන්නේ, දෙවියන්වහන්සේ කෙරෙහි වර්තමාන ආකල්ප සහ යේසුස්වහන්සේ සහ අපෝස්තුලුවරුන් විද්‍යාමාන කලදේ අතර ඇති ආගාධයක පැවැත්මයි.

## දෙවියන්වහන්සේගේ චරිතය

නමුත්, ස්වර්ගයේ සහ පෘතුවියේ මැවුම්කාරයාණන්වූ, සියලු ගෞරවනීය වන්දනාවට සුදුසු මෙම එකම දෙවියන්වහන්සේ, හුදෙක් අපුද්ගල බලයක් නොවේ. උන්වහන්සේ, තමන්වහන්සේගේම චරිතයක් හිමි පුද්ගලයෙක්ය. උන්වහන්සේහට සදාකාල සදාචාර ප්‍රතිපත්ති හිමි අතර ඒවා තමන්වහන්සේගේ ව්‍යවස්ථා සහ රීති මගින් මිනිස්වර්ගයා හට හඳුන්වාදුන්සේක.

දෙවියන්වහන්සේගේ චරිතය සම්බන්ද පළමු පැහැදිළි විස්තරය ඇතිවන්නේ ක්‍රි.පූ. 1400දී පමණ මෝසෙස් හටවූ එළිදරව්වේය. නික්මයාම සිද්ධීන් තුළ දෙවියන්වහන්සේ කෙරෙන් බොහෝ සංනිවේදන මොසෙස් ලද නමුත් ප්‍රත්‍යක්ෂවම තමන් තවමත් දෙවියන්වහන්සේ පුද්ගලයෙකු ලෙස නොදන්නා බැව් ඔහුට හැගුනු අතර ඔහු ඉල්ලීමක් කරයි:

> "ඔබ ඉදිරියෙහි කරුණාව ලැබී තිබේ නම්...මා විසින් ඔබ හැඳිනගන්නා පිණිස ඔබගේ මාර්ගයන් දැන් පෙන්නුව මැනව"

ඔහුගේ ඉල්ලීමට දෙවියන්වහන්සේ එකගවූ විට, මෝසෙස් එය විශාලනය කරයි: "ඔබගේ තේජස මට පෙන්නුව මැනව." බොහෝ අවස්ථාවලදී, මහත් ආලෝකය සහ බලප්‍රදර්ශනයන් විලස දෙවියනවහන්සේගේ "භෞතික" තේජස මෝසෙස් අත්දැක තිබුනි. මෙතැන, වඩා යමක් ඔහුට උවමනාය. මේ ගැන දෙවියන්වහන්සේ සංවේදිය:

> "මම මාගේ සියලු <u>ගුණවත්කම</u> නුඹ ඉදිරිපිටින් යන්ට සලස්වා ස්වාමීන්වහන්සේගේ <u>නාමය</u> නුඹ ඉදිරිපිට ප්‍රකාශකරන්නෙමි. (නික්මයාම 33:13-19).

මාර්ගය, තේජස, ස්වාමීන්වහන්සේගේ ගුණවත්කම උන්වහන්සේගේ නාමයේ ප්‍රකාශකොට, මෝසෙස් හට උන්වහන්සේ "හැඳිනගැනීමට" සලස්වයි. මෙම නාමය දැන් ප්‍රකාශයට පත්කරයිඃ

"ස්වාමීන්වහන්සේ ස්වාමීන්වහන්සේය. උන්වහන්සේ අනුකම්පාවෙන් පූර්ණවූ දයාවන්තවූ උදහස්වීමට ප්‍රමාදවන්නාවූ අධිකතර කරුණාව සහ සැබෑකමද ඇත්තාවූ දෙවිකෙනෙක්ය. උන්වහන්සේ දහස් ගණනකට කරුණාව පවත්වනසේක, අයුතුකමත් අපරාධයත් පාපයත් ක්ෂමාකරනසේක. වරදකරුවන් කවර ප්‍රකාරයකින්වත් නිදහස් නොකරනසේක..." (නික්මයාම 34:6,7).

එසේ, තමන්වහන්සේ විසින් ප්‍රකාශිත, බයිබලයේ දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ චිත්‍රය පහළවෙයි. උන්වහන්සේ සතුව දයාව, ඉවසීම, ගුණවත්භාවය සහ ක්ෂමාව මහත් කොටසක් ඉටුකරන නිශ්චිත සදාචාරත්මක චරිතයක් ඇති නමුත්, සියලු අවස්ථාවන්හිදීම උන්වහන්සේගේ "සත්‍යය" සමග එකගය. පසු පැමිණෙන පැරණි ගිවිසුම් පොත් තුළ, විශේෂයෙන් ගීතාවලිය (උදාහරණ ලෙස ගීතාවලිය 103 බලන්න) සහ දිවැසිවරු, මෙම විස්තරයේ ප්‍රතිරාව නිරන්තරයෙන් හමුවේ.

දෙවියන්වහන්සේගේ මෙම රූපනය, උන්වහන්සේගේ "ගුණවත්භාවය" සහ උන්වහන්සේගේ චරිතයේ "තේජස" ප්‍රකාශකරයි. සමාරියෙහි ස්ත්‍රියට මෙසේ ප්‍රකාශ කරනවිට යේසුස්වහන්සේගේ සිතුවිල්ලෙහි ඇත්තේ මෙම දෘෂ්ඨියයි, "දෙවියන්වහන්සේ ආත්මයය" (මූලාකරවන සුළු ආත්මයක් නොවේ) (යොහන් 4:24). දෙවියන්වහන්සේගේ චරිතය "ආත්මය" ලෙස විස්තර කර ඇත. එහි සිතුවිලි සහ තෘෂ්ණා ප්‍රකාශකරන මිනිස් මාංශයේ ස්වාභාවික චරිතය, යොහන් විසින් විස්තර කරන ලද "නපුරෙහි.... ලෝකයෙහි... මාංශයෙහි ආත්මයට" එරෙහි මහත් වෙනයක් ඇතිකරයි.

## දෙවියන්වහන්සේගේ ශුද්ධභාවය

මෙතෙක් අප සලකා බැලූ දෙයින් පැමිණෙන නිගමනය නම්, තම ස්වාභාවයෙන් සහ චරිතයෙන් දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට වඩා වෙනස් බවය. උන්වහන්සේ මනුෂ්‍ය දැස්වලට නොපෙනෙන, "ලගාවිය නොහැකි ආලෝකයෙහි" වසන බව පාවුල් පවසයි. නමුත් උන්වහන්සේගේ "සිතුවිලි" (නිතරම උන්වහන්සේගේ අභිප්‍රාය හගවන වචනයක්) මිනිසාට

වඩා මහත්ය. ඔහු පවසන්නේ:

"අහස පොළවට වඩා උස්ව තිබෙන්නාක් මෙන් මාගේ මාර්ග නුඹලාගේ මාර්ගවලටත් මාගේ යෝජනා නුඹලාගේ යෝජනාවලටත් වඩා උස්ව තිබේ" (යෙසායා 55:9).

ඉදින්, දෙවියන්වහන්සේ "ශුද්ධය": එහි අරුත උන්වහන්සේ මනුෂ්‍යවර්ගයාගෙන් "වෙන්කර" ඇති බවයි. දෙවියන්වහන්සේ තවත් එක් මනුෂයයෙක් යැයි සලකා, උන්වහන්සේගේ අභිමුඛයට අපරීක්ෂාකාරීව අමන ලෙස මිනිසාට යානොහැක. උන්වහන්සේ පෙන්වා දුන් මාර්ගයෙන් හැර, ඔවුන්ගේ පවු නිසා උන්වහන්සේ කිසිලෙසකින් අභිමුඛවිය නොහැකිය. වන්දනාවේදී අභිමුඛය සහ පුදකිරීම කල හැක්කේ, දෙවියන්වහන්සේ විසින්ම පත්කල, ආරොන්ගේ පුත්‍රයන්වූ පූජකවරුන් මගින් පමණක් බැවි ඉශ්‍රායෙල්වරුනට ව්‍යවස්ථාවේ උගන්වන ලදී. ව්‍යවස්ථාවේ ඉලක්කය වූයේ ඉශ්‍රායෙල් ජනතාව තුළ උන්වහන්සේට සමාන මනස සහ චරිතය ගොඩනැගීමයි. එමනිසා උන්වහන්සේ ඔවුනට අණකලේ: "මා ශුද්ධ බැවින්, නුඹලාත් පවිත්‍රව ශුද්ධව සිටපල්ලා" (ලෙවිකථාව 11:44) යනුවෙනි. ක්‍රිස්තුස්වහන්සේගේ පළමු අදහන්නන්ට ලියමින් පේතෘස් මෙය ප්‍රතිරාව කරයි:

"නුඹලා කැඳවූ තැනන්වහන්සේ ශුද්ධව සිටින්නාක් මෙන් නුඹලාත් නුඹලාගේ මුළු හැසිරීමේදී ශුද්ධව සිටපල්ලා" (1 පේතෘස් 1:15).

සාමරීයෙහි ස්ත්‍රියට යේසුස්වහන්සේ දැනටමත් මෙසේ පවසා තිබුනි:

"සබෑ නමස්කාරකරන්නන් විසින් ආත්මයෙන්ද, සැබෑකමින්ද පියාණන්වහන්සේට නමස්කාරකරන කාලය පැමිණෙන්නේය. දැනටම පැමිණ තිබේ. මක්නිසාද පියාණන්වහන්සේ තමන්ට නමස්කාරකරන්නන්වන පිණිස එබඳුවූවන් සොයනසේක. දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාරකරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කලයුතුය" (යොහන් 4:23,24).

සැබෑ අදහන්නන්ගෙන් දෙවියන්හන්සේට අවශ්‍යවන "ශුද්ධවූභාවය" අතීතයේ දවස්වල තාපසයන් පෙන්වාදුන් ශ්‍රමණ ආත්මය නොවේ; තවද දෙවියන්වහන්සේ වන්දනාකරනවායැයි පවසාගනිමින් "සියලු වතාවත් තුළ හැසිරෙමින්" නමුත් දෙවියන්වහන්සේගේ ආත්මයට වඩා මිනිස්

අසංවර, තෘෂ්ණාවෙන් පිරි සහ උඩගුකම පෙන්වන ආත්මික මනසක් පිළිබිඹු කිරීම නොවේ. ඉශ්‍රායෙලයේ එවන් ආකල්පය දෙවියන්වහන්සේ නොඉවසුසේක. විනිශ්චයේදී යේසුස්වහන්සේද එසේවනු ඇත. "මම කිසි කලෙක නුඹලා නොහැඳින්නෙමි. මා කෙරෙන් අහක්ව පලයල්ලා" (මතෙව් 7:23)යැයි සමහරෙකුට උන්වහන්සේ පවසනවා ඇත.

## පියාණන් ලෙස දෙවියන්වහන්සේ

"ස්වර්ගයෙහි වැඩසිටිනා අපගේ පියාණෙනි..." "ස්වාමීන්වහන්සේගේ යාච්ඤාවේ" මෙම පළමුවැනි පෙළ නවගිවිසුමෙහි වඩාත් හොඳින් දන්නා එකක් විය. වර්තමානයෙහි එය වඩා අඩුතරමින් උච්චාරණය කෙරේ. නමුත් එහි යෙදීමේ උච්ච යුගයෙහි පවා, "පියාණන්" නමැති වදන පොදු සම්මත ක්‍රමයට විනා, එහි ගම්‍යය හගවන සිතුවිල්ලෙන් පාවිච්චි නොකල බැව් කිවයුතුය.

පැරණි ගිවිසුමෙහි දවස්වල දෙවියන්වහන්සේ තමන් "පියාණන්" ලෙස එළිදරව් කර තිබුනි. "ඉශ්‍රායෙල් මාගේ පුත්‍රයාය. මාගේ කුළුඳුලාය" (නික්මයාම 4:22) යන්න, මිසරයේ පාරාවෝ සඳහා උන්වහන්සේගේ ප්‍රකාශය විය. ඔවුන්ගේ දිගු සියවස් ගණන් අත්දැකීම් තුළදී, විශ්වාසවන්තයෝ මෙම සම්බන්දය අගය කලහ:

> "පියෙක් තම දරුවන්ට අනුකම්පා කරන්නාක් මෙන් ස්වාමීන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ට අනුකම්පා කරනසේක. මක්නිසාද උන්වහන්සේ අපේ ස්වභාවය දන්නාසේක. අප දූලිබව උන්වහන්සේ සිහිකරනසේක " (ගීතාවලිය 103:13-14).

නව ගිවිසුමෙහි, පියාණන් ලෙස දෙවියන්වහන්සේගේ උත්තරීතර ප්‍රකාශවීම, උන්වහන්සේගේ දයාබර පුත්‍රයාණන්වූ පුද්ගලයා තුළෙහිය. යේසුස්වහන්සේ නිතරම "මාගේ පියාණන්" ලෙස දෙවියන්වහන්සේ හැඳින්වූ අතර, ගෝලයන් ආමන්ත්‍රණය කිරීමේදී එය "ඔබගේ ස්වර්ගීය පියාණෝ" විය. ගීතාවලිය කර්තෘන් සහ දිවැසිවරුන් හට ඉතා ප්‍රියමනාප දෙවියන්වහන්සේගේ අපිරිමිත දයාව, පාපය සඳහා උන්වහන්සේගේ පුත්‍රයාදීමෙන් පෙන්වන ලදී. එසේ, විශ්වාසවන්තයන් හට දෙවියන්වහන්සේ සමග නව සබඳතාවයක් ප්‍රදානය කරන අතර එහිදී ඔවුන් "ක්‍රිස්තුස්වහන්සේ සමග උරුමකරුවන්" පමණක් නොව, "දෙවියන්වහන්සේගේ පුතුන් සහ දූවරුන්" ද වන්නේය. යොහන් මෙසේ ප්‍රකාශ කරයි:

"අපි දෙවියන්වහන්සේගේ දරුවෝයැයි කියනු ලබන ලෙස පියාණන්වහන්සේ කෙබඳු ප්‍රේමයක් අපට වදාළසේක්දැයි බලාපල්ලා. අපි එබඳුවෝමය " (1යොහන් 3:1).

නමුත් මෙම අවිධිමත් කුළුපග දවස්වල, දෙවියන්වහන්සේ "අපගෙන් කෙනෙක්" ලෙස සිතීමටත්, සැබැවින්ම එසේ ආමන්ත්‍රණය කිරීමටත් පුරුදුවීම ඉතා පහසුය. යේසුස්වහන්සේ සැමවිටම, විශේෂයෙන් උන්වහන්සේගේ යාච්ඤාවලදී, තම ප්‍රමුඛතාවයන් පැහැදිළිව පැවැත්විය. "ස්වර්ගයටත් පොළොවටත් ස්වාමිවූ පියාණෙනි... ඔබට ස්තුතිකරමි" (මතෙව් 11:25) යන්න අපට අවවාද කරන්නේ දෙවියන්වහන්සේ සැබවින්ම අපගේ පියාණන්වුවත්, උන්වහන්සේ "ස්වර්ගයෙහිත් පොළොවෙහිත් ස්වාමීව" සිටින බවත්, එසේ වන්දනා කල යුතු බවත්ය. උන්වහන්සේ කුරුසියගතවීමට ස්වල්ප වේලාවකට පෙර තම ගෝලයන් සඳහා යාච්ඤාකරමින් දෙවරක් සෘජුව දෙවියන්වහන්සේ ආමන්ත්‍රණය කරයි: "ශුද්ධවූ පියාණෙනි... ධර්මිෂ්ඨ පියාණෙනි" (යොහන් 17:11,25). මෙතැන ඇත්තේ කුළුපග බවක් නොව මිනිසා කෙරෙන් "වෙනස්" කමක් විචක්ෂණව හඳුනාගැනීමකි.

එසේම අපෝස්තුලුවර පාවුල්, ව්‍යවස්ථාව උපුටා දක්වමින් සහ එම කිවමන කොරින්තියේ අදහන්නන්ට යොදා ගනිමින්, ග්‍රීක සමාජයේ පිළිම වන්දනාව සහ මිත්‍යාදෘෂ්ටික ආභාශයන්ගෙන් "පිටතට පැමිණෙන්නට" සහ "වෙනස්ව සිටීමට" ඔවුන් උනන්දු කරයි. "නුඹලාට පියෙක් වන්නෙමි. නුඹලාද මට පුත්‍රයන් දූවරුන් වන්නහුයැ"යි දෙවියන්වහන්සේ ඔවුනට පොරොන්දු වෙයි. නමුත් පාවුල් උපුටා ගැනීම ආරම්භකරන්නේ, "ස්වාමීන්වහන්සේ කියනසේක" යනුවෙනි.

එසේ තවදුරටත්, තම කියවන්නන් පවිත්‍රව සිටින්නට උනන්දු කරවමින් "මාංශයේද ආත්මයේද සියලු කිළුටුකම් වලින් අපම පවිත්‍ර කර ගනිමින්, "දෙවියන්වහන්සේ කෙරෙහි භයින් යුක්තව ශුද්ධකම සම්පූර්ණකර ගනිමු" යනුවෙන් ගෞරවනීය වන්දනාවට උනන්දු කරවයි. (2කොරින්ති 6:17-7:1).

තම ගෝලයන් සඳහා යේසුස්වහන්සේ උගැන්වූ යාච්ඤාවේදී, උන්වහන්සේ "ස්වර්ගයෙහි වැඩසිටින අපගේ පියාණෙනි" ලෙස දෙවියන්වහන්සේ ආමන්ත්‍රණය කලහ (මතෙව් 6:9). තම දරුවන් සඳහා සියලු සැලකිල්ල පෙන්වමින් සහ අවධානය යොදවමින්, දෙවියන්වහන්සේ

විශ්වාසවන්තයනට සැබවින්ම පියාණෝය. නමුත් එම "පුත්‍රයෝ සහ දූවරුන්" උන්වහන්සේගේ දයාව සහ කරුණාව අගය කලයුතු අතර උන්වහන්සේට සුදුසු ගෞරවනීය වන්දනාව කිසි දිනෙක අමතක නොකල යුතුය. අපගේ මෙම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ මිනිස් අයිතිවාසිකම් සහිත යුගයේදී මෙම සමතුලිතතා ආකල්පය බොහෝසේ තර්ජනයට ලක්වී ඇත. බයිබලය පමණක් මෙම සමතුලිතතාවය රැකීමට අපට උදව්වේ.

## දෙවියන්වහන්සේගේ ප්‍රේමය

අද බොහෝ පුළුල් ලෙස අදහන දෘෂ්ඨිය නම් "දෙවියන්වහන්සේගේ ප්‍රේමය" යන්නැයි. තම ලිපියෙහි (1යොහන් 4:16) සහ තම සුභාරංචියෙහි අපෝස්තුලුවර පාවුල් එසේ නොකියන්නේද? මිනිසුන් සහ ගැහැණුන් විනාශනොවී ජීවත්වන පිණිස "දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලොකයාට ප්‍රේමකලසේක" දෙවියන්වහන්සේ සම්පූර්ණ දයාවය, උන්වහන්සේ කිසිවෙක් විනිශ්චය කරන්නේවත් ප්‍රතික්ෂේප කරන්නේවත් නැතැයි කියනු ලබත්. මෙම සිතුවිල්ලෙහි ප්‍රතිපලය නම් මිනිස් තෘෂ්ණාවන්ගෙන් පැමිණි දෙවියන්වහන්සේ ගැන ආවේගාත්මක දෘෂ්ඨියකි. දෙවියන්වහන්සේ කෙරෙහි මෙම දෘෂ්ඨිය වරක් විස්තර කළ සී.එස්.ලුවිස් පැවසුවේ, එය ඔවුන්ගේ සෑම ඉල්ලීමක්ම ඉටුකරමින් තම දරුවන් ප්‍රීතියෙන් තැබීමට පමණක් උත්සුකවන්නාවූ "කරුණාවන්ත සීයා කෙනෙකු" ලෙසය.
නමුත් මෙය, බයිබලයේ එළිදරව්කර ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමය අශිෂ්ට විපර්ත කිරීමකි. තම දරුවන්ගේ සුභසාදනය අවංකව බලාපොරොත්තුවන්නාවූ කිසිම මිනිස් පියෙකු එය ඔවුන්ගේ සෑම අපේක්ෂාවක්ම පිනවීමෙන් නොලැබෙන බැව් දනී. දෙවියන්වහන්සේ උත්තර්තර පියාණන්වන අතර ඔවුන් තමන්වහන්සේගේ සත්‍ය චරිතයත්, දයාව සහ ශුද්ධවූභාවය පිළිබිඹු කරන්නට මනුෂ්‍යවර්ගයා මැවූසේක. එමනිසා "දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූසේක" (උත්පත්ති 1:27). මිනිසුන් සහ ගැහැණුන්හට විචක්ෂණයේ, තේරුම්ගැනීමේ, සවිංඥානයේ සහ කැමැත්තේ අපූර්ව බලයයන් දුන්සේක-මේ සියල්ල සතුන් සඳහා ප්‍රතික්ෂේප කරන ලදි-එසේ කලේ ඔවුන් ඒවා පාවිච්චිකර උන්වහන්සේ වටහාගන්නට, ඔවුන් සඳහා තමන්වහන්සේ අපේක්ෂාකල සදාකාලික ඉරණම සඳහා සුදුසු චරිතයක් ගොඩනගන්නටත්ය.

"සියල්ලන්ම පසුතැවිලිවනවා මිස කිසිවෙක් විනාශවනවාට උන්වහන්සේ නොකැමතිව" (2පේත්‍රැස් 3:9), සියලු මනුෂ්‍යයන් ගළවනු

ලැබ සැබෑව දැනගැනීමට පැමිණෙනවාට කැමතිවූ (1තිමෝති 2: 4) දුබල මනුෂ්‍යවර්ගයා කෙරෙහි පෙන්වූ මෙම ආකල්පය, ශුද්ධලියවිල්ලේ තමන්වහන්සේගේ "පුත්‍රයා" සහ "භාර්යාව" ලෙස සඳහන් ඉශ්‍රායෙල් ජාතිය සමග කරන ගණුදෙනුවලදී පෙන්වනු ලැබේ.

මෙම මානව සම්බන්දතා තේරුම්ගැනීමෙන් සහ ඒවායේ සාර්ථකත්වය අවශ්‍යයෙන්ම රඳාපවතින්නේ අන්‍යෝන්‍ය සහජීවනය සහ ආත්මපරිත්‍යාගයෙන් බැව් දැනගැනීමෙන්, තම පුද්ගලික දරුවන් කෙරෙහි දෙවියන්වහන්සේගේ ඉවසීමේ සහ කරුණාවේ ගුණයයන් තේරුම් කරගැනීම පහසුවේ.

තම දරුවන්ගේ සුභසාධනය ගැන දෙවියන්වහන්සේ සතු නොනිමි සැලකිල්ල තම අනුගාමිකයන්ට විස්තර කරමින්, යේසුස්වහන්සේ නාස්තිකර පුත්‍රයාගේ කථාව කීසේක. තම පුත්‍රයා ඔහුටහිමි කොටස සහ අයිතිවාසිකම් ඉල්ලාසිටින විට පියාගේ වේදනාව ප්‍රතිරාවය කරන්නේ තමන්වහන්සේගේ මාර්ග සහ ප්‍රේමණීය සැලකිල්ල නොසලකා, මිනිසුන් සහ ගැහැණුන් තමන්ගේම සිතුවිල්ලට ක්‍රියාකරන්නට බලාපොරොත්තුවනවිට හැගෙන දෙවියන්වහන්සේගේ වේදනාවයි. මෙම උපමාවේදී, එම පියාගේ නිරන්තර සෝදිසිය පිළිබිඹුවන්නේ දෙවියන්වහන්සේගේ සෝදිසියයි. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පූජාවීම තුළින් සපයන්නාවූ පාප ආවරණය මගින් මනස්තාවන්නාවූ පවුකාරයන් පිළිගැනීමට උන්වහන්සේ නිරතුරුවම බලාසිටිනසේක.

දෙවියන්වහන්සේ ගැන මෙම විස්තර කිරීම් සොයාගත හැක්කේ නව ගිවිසුමේ හෝ ස්වාමීන්වහන්සේගේ උගැන්වීම් තුළ පමණක් නොවේ. වංක භාර්යාවක් සමග දිවැස්වර හොෂෙයාගේ පෞද්ගලික අත්දැකීම්, අයාලේ යන ඉශ්‍රායෙල් ජාතිය මගින් දෙවියන්වහන්සේ ලද සැලකිල්ලට වෙනස් නොවේ. හොෂෙයා තම භාර්යාව නැවත බාරගත් ලෙස, දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් නැවත බාරගැනීම සඳහා සියලුවේලෙහි උන්වහන්සේගේ හස්තය දිගුකල සේක. එසේ වුවත්, උන්වහන්සේ තම ජනතාව කල දෙය අනුමත කලේ නැත; ඔවුන්ගේ වංකභාවය නිසා ඔවුන් විඳිනලද අත්දැකීම්වල අරමුණවූයේ උන්වහන්සේගේ දරුවන් කෙබඳු ජීවිතයක් ගතකලයුතුදැයි ඉගැන්වීමය.

ඉදින්, මතුවෙන ශ්‍රේෂ්ඨ නියමය වනුයේ ඔවුන් සඳහා දෙවියන්වහන්සේගේ අභිප්‍රායේ පළමු ස්ථානය අයත්වන්නේ මිනිසුන්ගේ සහ ගැහැණුන්ගේ පුද්ගලික ආශාවන් නොව, ඔවුන්ගේ අවසාන යහපත

යන්නැයි. නව ගිවිසුම බහුල ලෙස ප්‍රකාශ කරන පරිදි තම දරුවන් සඳහා දෙවියන්වහන්සේගේ ආකල්ප සැබවින්ම දයාව, කරුණාව, අනුග්‍රහය සහ ක්ෂමාවයි. නමුත් ඒ සියල්ල උන්වහන්සේගේ අභිප්‍රායේ ඔවුන්ගේ අවසාන සුභසාධනය නමැති රාමුව තුළය.

## දෙවියන්වහන්සේගේ කෝපය

නමුත් මිනිසුන් සහ ගැහැණුන්, උන්වහන්සේට පිටුපා, උන්වහන්සේගේ අධිකාරිය ප්‍රතික්ෂේප කර, උන්වහන්සේගේ ව්‍යවස්තාව නොසලකා, තමන්ගේම කැමැත්ත කිරීමට ගියහොත් කුමක්ද?

එක් කරුණක් පැහැදිළිය. දෙවියන්වහන්සේ ස්වර්ගයේ සහ පොළවේ ස්වමින් බැවින් සහ මිනිස්වර්ගයාගේ මැවුම්කරු බැවින්, උන්වහන්සේට ඔවුන්ගේ කැරලිගැසීම නොසලකා හැරිය නොහැක. මක්නිසාද එය තමන්වහන්සේම මැවූ අධිකාරිත්වය අත්හැරමවන බැවිනි. තත්වය වෙනස් කරන්නටත්, මිනිසුන් තම මාර්ගය වෙනස් කරවීමටත් උන්වහන්සේ උත්සහ ගතයුතුය. උන්වහන්සේ මෙය ක්‍රියාත්මක කරන්නේ ඔවුන් මත පීඩනය ගෙනෙමින්ය. පැහැදිළිම උදාහරණයක් නම්, යෝෂුවාගේ මරණින් පසු විනිශ්චයකාරයන් යටතේ ඉශ්‍රායෙල්ගේ තත්වයයි.

> "ඉශ්‍රායෙල් පුත්‍රයෝ ස්වාමින්වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව තිබුනු දේ කලෝය. ඔවුහු තමන්ගේ දෙවිවූ ස්වාමින්වහන්සේ සිහිනැතිකොට බාල් දේවතාවුන්ටත් අෂේරින්ටත් (මිත්‍යාදෘෂ්ඨික දෙවිවරු) සේවය කලෝය. එබැවින් ස්වාමින්වහන්සේගේ උදහස ඉශ්‍රායෙල්ට විරුද්ධව ඇවිළ, මෙසපොතාමියේ රජවූ කූසන්-රිෂාතයිම් අතට උන්වහන්සේ ඔවුන් පාවා දුන්සේක. ඉශ්‍රායෙල් පුත්‍රයෝ ඔහුට අට අවුරුද්දක් මෙහෙකලෝය. ඉශ්‍රායෙල් පුත්‍රයන් ස්වාමින්වහන්සේට මොරගැසූ කල, ස්වාමින්වහන්සේ...ගැළවුම්කාරයෙකු නැගිටුවාදී ඔවුන් ගැලවූසේක" (විනිශ්චයකාරයා 3:7-9).

පාඩම් පැහැදිලිය. තමන් මිසරයෙන් මුදවාගන්නාලද ඉශ්‍රායෙලයේ තම දෙවියන්වහන්සේ අතහැරදැමීම, උන්වහන්සේගේ කෝපය ඇවිලිය. විදේශ ආක්‍රමණය සහ වහල්භාවය ලෙසින් උන්වහන්සේ ඔවුන් මත පීඩනය ගෙනෙනසේක. කලකට පසු, පීඩනය ප්‍රතිපලය දුනි-ඉශ්‍රායෙල් මනස්තාපවුනි. බැලුබැල්මට එම මනස්තාපය අව්‍යාජවූයේ දෙවියන්වහන්සේ වහාම ප්‍රතිචාර දක්වා මිදීම ගෙන ආ හෙයිනි.

ඉශ්‍රායෙල් ඉතිහාසයේ මෙම රටාව නැවත නැවත සිදුවෙයි. ක්‍රි.පූ. 700දී

පමණ සමාර්යේ පදනම්වූ උතුරු රාජධානිය ඇසිරියානුන් විනාශකරයි; අන්තිමේදි ක්‍රි.පූ. 600දි පමණ යුදාහි දකුණු රාජධානිය බැබිලෝනියානුන් පෙරලා දමයි. දෙවියන්වහන්සේ මෙම ආක්‍රමණවලට ඉඩහලේ ඇයි? ජනතාවට ආයාචනා කිරීමට සහ අවවාද කරවීමේ උත්සාහයෙන් උන්වහන්සේ යැවූ දිවැසිවරුන්ට, "පණිවිඩකාරයන්ට සරදම්කර, උන්වහන්සේගේ වචන සුළුකර නිසා"වෙනි. මෙම වැදගත් ප්‍රකාශයෙන් වාර්තාව අවසන් වෙයිඃ

"සුවයක් නැති තරම් ස්වාමීන්වහන්සේගේ කෝපය තමන්ගේ සෙනගට විරුද්ධව පැමිණෙන ලෙස..." (2ලේකම් 36:16).

සියලුම ආයාචනාවලට එරෙහිව ජනතාව මනස්තාප නොවන විට, දෙවියන්වහන්සේ තත්වය අවසානයකට ගෙනෙයි. පෘතුවිය දූෂිතව සහ "පොළොව බලහත්කාරයෙන් පිරී...මාංසමයවූ සියල්ලෝ පොළොවෙහි තමන්ගේ මාර්ග දූෂ්‍යකරගෙන" (උත්පත්ති 6:11,12) ඇති විට, ජලගැල්මේදි උන්වහන්සේ කලේ මෙයයි. මනුෂ්‍යවර්ගයාගේ එම පරම්පරාව මනස්තාප නොවුනි. ඔවුන් පුනරුත්තාපනය කල නොහැකි විය. එකම විසදුම වුයේ ශේෂයක් තුළින් දෙවියන්වහන්සේගේ අභිප්‍රාය පවත්වාගෙනයාම සඳහා ඔවුන් ඉවත්කිරීමයි.

අප නව ගිවිසුමට පැමිණෙන්නට පළමුවෙන්, පැරණි ගිවිසුමෙහි දෙවියන්වහන්සේ සඳහා පොදු වදන් දෙකක් සැලකිය යුතුව ඇත. ජේද කිහිපයක දෙවියන්වහන්සේ "නොඉවසන්නාවූ දෙවිකෙනෙකි" යනුවෙන් ප්‍රකාශකොට ඇත. මෙම වදන් නූතන කියවන්නන් හට අනාදරයක් හඟවන්නේ එය ජනප්‍රිය අදහසින් ගත් නිසාත් යම් මිනිස් දුබලතාවයක් හඟවන නිසාත්ය. නමුත් මෙය එහි ශුද්ධලියවිලි අදහසේ වැරදි අවබෝධයකි. එහිදි එය සෑම විටම යෙදෙන්නේ, තමන්වහන්සේ ප්‍රතික්ෂේපකොට, පිළිම වන්දනාවට හැරුණු ඉශ්‍රායෙල් හට අවවාදයක් ලෙසිනිඃ

"අන් දෙවිවරුන්වන නුඹලා වටකර සිටින ජාතීන්ගේ දෙවිවරුන් අනුව නොයල්ලා...නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ අන්‍යභක්ති නොඉවසන්නාවූ දෙවිකෙනෙක් බැවින්, උන්වහන්සේගේ උදහස නුඹට විරුද්ධව ඇවිල... විනාශකරනවා ඇත." (මෝසෙස් විසින් ඉශ්‍රායෙල් හට. ද්විතිය කථාව 6:14-15).

එම මුල් වචනයම සමහර අවස්ථාවලදි "කැපවූ" සහ "අතිශය උද්යෝගී"

ලෙස පරිවර්තනය කිරීම සැලකිය යුතුය. තමන්වහන්සේ අතිශය උද්යෝගි කුමක් සඳහාදැයි දෙවියන්වහන්සේ අපට පවසනසේක.

> "මම ස්වාමින්වහන්සේය. මාගේ නාමය එකය. මාගේ ගෞරවය අන් කෙනෙකුටවත් මාගේ ප්‍රශංසාව රූපවලටවත් නොදෙන්නෙමි" (යෙසායා 42:2).

ස්වර්ගයේ සහ පෘතුවියේ දෙවියන්වහන්සේ, තමනට හිමි වන්දනාව හුදු මිනිස් නිපදවීමේ හෝ සිතුවිල්ලේ භාණ්ඩ සඳහා නොයෙදීමට අධිෂ්ඨාන කර ඇත. මෙය උන්වහන්සේගේ "කැපවීමයි". එය උන්වහන්සේගේ කෝපය සමග සම්බන්ද අතර අවසානයේදී උන්වහන්සේ තමන්වහන්සේගේ වන්දනාව ප්‍රතික්ෂේප කරන්නා විනිශ්චය කරනු ලබනසේක.

දෙවැනි වදන "දෙවියන්වහන්සේගේ පළිගැනීමය". නූතන භාවිතය ඉඟිකරන්නේ දෙවියන්වහන්සේට නොසුදුසු, මනුෂ්‍ය ස්වාභාවයේ ලක්ෂණයක්වූ පිළිගැනීමේ ගුණයකි. නැවතත්, බයිබල අරුතින් එම වදන තේරුම්ගැනීම අවශ්‍යය. "දෙවියන්වහන්සේගේ පළිගැනීම" භාවිතාවන්නේ උන්වහන්සේගේ පවුකාරයන් විනිශ්චයේදීය. නමුත් විශ්වාසවන්තයන් ගැළවීම සම්බන්දයෙන්ද එම විශේෂණය යොදාගනී. මෙම පසුව සඳහන්කරන පැත්ත යෙසායා කදිමට විස්තර කරයි.

> "බෙලහීන අත් බලවත්කර... භයසිත් ඇත්තන්ට කථාකොට, භයනොවී ශක්තිමත්වෙයල්ලා. බලව නුඹලාගේ දෙවියන්වහන්සේ පළිගැනීමවන දෙවියන්වහන්සේ විපාකදීම ඇතුව උන්වහන්සේම ඇවිත් නුඹලා ගළවනසේක" (යෙසායා 35:3,4).

දෙවියන්වහන්සේගේ පළිගැනීම සැමවිටම ධර්මිෂ්ඨ ප්‍රතිවිපාකයය. නොකඩවා කරගෙන යන පාපය නිසා සුදුසු විනිශ්චයකි. මිනිස් මුරණ්ඩුකමේ සහ උඩගුභාවය ඉදිරිපිට දෙවියන්වහන්සේගේ ශුද්ධවූභාවය සහ සත්‍යය තහවුරු කිරීමය.

## නව ගිවිසුම සහ විනිශ්චය

දිගටම පවතින අධර්මිෂ්ඨභාවය සහ පාපය සඳහා ඉශ්‍රායෙල් ජාතිය මත දෙවියන්වහන්සේගේ විනිශ්චය පැමිණියා සේ, අදේවවාදය සහ අනාචාරය නිසා එසේම අපගේ ලෝකය මතද එය පැමිණෙනු ඇත. එක් විශේෂිත පේදයක "මනුෂ්‍යපුත්‍රයා ප්‍රකාශවන දවස" (එනම්, උන්වහන්සේ

නැවත පාතුවියට පැමිණෙන විට), ජලගැල්ම සහ සොදොම් හා ගොමෝරා හි විනිශ්චයන් සමග යේසුස්වහන්සේ සසඳත්.,

> "නෝවාගේ දවස්වලදී වුවාක් මෙන්ම මනුෂ්‍යපුත්‍රයාගේ දවස්වලදී වන්නේය..." ලූක් 17:26-30).

ලෝකය සඳහා විනිශ්චයේ දවසක් ඇතිවන වග නව ගිවිසුමේ අවල තේමාවකි. "ස්වාමිවූ යේසුස්වහන්සේ තමන්ගේ පරාක්‍රමයේ දූතයන් සමග ඇවිලෙන්නාවූ ගින්නෙන් යුක්තව ස්වර්ගයෙන් එළිදරව්වී, දෙවියන්වහන්සේ නාදුනන්නන්ටත් අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේගේ සුභාරංචියට කීකරු නොවන්නන්ටත්..." (2තෙසලෝනි 1:6-10) දෙවියන්වහන්සේ විනිශ්චය කරන බැව් පාවුල් තෙසලෝනි විශ්වාසිකයන්ට සහතිකවෙයි. (මෙම මුලු ජේදයම කියැවිය යුතුය).

මෙය විනිශ්චයේ සෘජු විස්තරයක්වන අතර එය බොහෝ නූතන චින්තකයන් කම්පනයට පත්කරයි. නමුත් පාවුල් ව්‍යවස්ථාවේ සහ දිවැස්වරුන්ගේ භාෂාව භාවිතාකරයි: "පළිගැනීම" යනු දැනටමත් සාකච්ඡාකර ඇති ධර්මිෂ්ඨ විපාකයය; "දෙවියන්වහන්සේ නොදන්නා" අය "උන්වහන්සේ නොපිළිගන්නා" අය සේම අඥානය. සුභාරංචියට "කීකරු නොවීම" සැබවින්ම සක්‍රියව එය ප්‍රතික්ෂේප කර අකීකරු වීමය. අප හට කුමක් හැගුනත්, පාවුල්ගේ පණිවිඩය ගැන සැකයක් නැත.

නමුත් ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණිවිට, සුභාරංචිය දැනගත් අය සඳහා පුද්ගලික විනිශ්චයක් ඇතිවන බැව් නව ගිවිසුම ප්‍රකාශකරයි. "ධර්මිශ්ටයන්", විශ්වාසවන්තව සිටීමට උත්සාහ ගත් අය සහ "නපුරුවූවන්", අවිශ්වාසිකයන් අතර නිශ්චිතයක් ඇතිකරනු ඇත. පාවුල් ප්‍රකාශකල පරිදි:

> "අපි සියල්ලෝම දෙවියන්වහන්සේගේ විනිශ්චයාසනය ඉදිරියෙහි පෙනී සිටිමුව.... අප එක් එක්කෙනා තම තමා ගැන දෙවියන්වහන්සේට ගණන්දෙනවා ඇත" (රෝම 14:10-12).

එම නිසා විනිශ්චය, දෙවියන්වහන්සේගේ අභිප්‍රාය එළිදරව්වීමේ කොටසක්ද, "දෙවියන්වහන්සේගේ කෝපය" යනුවෙන් ඇතැම්විට ශුද්ධලියවිල්ලේ හඟවන, පවතින පාපය නොඉවසීමේ අධිශ්ඨානයත්ය.

## අපගේ දෙවියන්වහන්සේ සත්‍යය

අපැහැදිළි සහ අඳුරු භාවයෙන් බොහෝ දුරස්වූ, විස්තරාත්මකව

පිරිපුන් බයිබලයේ දෙවියන්වහන්සේගේ චිත්‍රයක් පෙන්වීම සඳහා ලියුදේ ඇති තරම්ය. සර්වබලධාරි දෙවියන්වහන්සේ ස්වභාවයෙන් සදාකාලික සහ බලයෙන් මහිමාන්විත පමණක් නොව, උන්වහන්සේ ලෝකයේ යථාර්ථය සහ මිනිස් ස්වභාවය ගැනත් කටයුතු කරන දෙවිකෙනෙකි. පෘතුවිය මත වාසය කිරීම සඳහා මිනිස්වර්ගයා මැවීමෙන් ආරම්භකර, තම සසල නොවන අභිප්‍රායවූ "තම නාමය සඳහා ජාතීන් අතරින් ජනතාවක් තෝරා" ගැනීම එතැන් සිට අනුගමනය කලසේක. මහත් ව්‍යාකුල සහ භීතිය ඇති කාලයක පෘතුවිය මත උන්වහන්සේගේ පුත්‍රයාගේ නැවත පැමිණීම සමග, එම අභිප්‍රාය දැන් උච්චස්ථානයට ලගාවෙමින් ඇත. උන්වහන්සේගේ නාමය ලෝකයේ එක් කෙලවරක සිට අනෙක් කෙලවරතෙක් දැනගනු ඇත. එය මෙම දවසේ සූදානම සඳහාය:

> "ජලයෙන් මුහුද වැසී තිබෙන්නාක් මෙන් ස්වාමීන්වහන්සේගේ තේජස දැනගැන්මෙන් පොළොව පිරියන්නේය" (හබක්කුක් 2:14).

එතෙක්, උන්වහන්සේගේ විශ්වාසවන්ත සේවකයන්වීමට අපේක්ෂාකරන, එම එළිදරව්වීම සඳහා ඉවසීමෙන් සේවය කරන්නාවූ අප ගැන කුමක්ද? බොහෝ ප්‍රබුද්ධ කරන්නාවූ, නව ගිවිසුම් ප්‍රකාශ දෙකක් මෙන්න:

> "සියලු මනුෂ්‍යයන් ගළවනු ලැබ, සැබෑව දැනගැනීමට පැමිණෙනවාට කැමතිවූ අපගේ ගැළවුම්කාරයාණන් වන දෙවියන්වහන්සේ(ය)" (1තිමෝති 2:3,4).

> "ස්වාමීන්වහන්සේ ප්‍රමාද නොවනසේක... සියල්ලන්ම පසුතැවිලි වනවාට මිස කිසිවෙක් විනාශවනවාට උන්වහන්සේ නොකැමතිව..." (2පේතෘස් 3:9).

මතුවෙන පළමු කම්පිත සිතුවිල්ල නම් මනුෂ්‍යවර්ගයා කෙරෙහි දෙවියන්වහන්සේ තුළ ඇති කරුණාවන්ත අභිලාෂයයි. උන්වහන්සේගේ කැමැත්ත ඔවුන් සියල්ලන්ගේ සුභසාධනය සහ ඔවුන් මිය නොයා ජීවත්වීමයි. නමුත් දෙවැන්න නම්, ඔවුන්ගෙන්ද යම් ක්‍රියාවක් උන්වහන්සේට අවශ්‍යය බවය. බයිබලයේ, උන්වහන්සේගේ වචනය තුළ උන්වහන්සේගේ ගැළවීමේ සත්‍යය එළිදරව්කොට ඇති අතර එය කුමක්දැයි දැනගන්නා ලෙස උන්වහන්සේ ඔවුන්ගෙන් බලාපොරොත්තුවනසේක. ක්‍රිස්තුස්වහන්සේ සහ අපෝස්තුලුවරු විසින් ප්‍රකාශිත සුභාරංචියේ ඇති එම සත්‍යය, "සිතෙහි වෙනස්වීමක්" තුළින්

තම දුබලකම් හඳුනාගැනීමට ඔවුන් අනිවාර්යයෙන්ම කැඳවනු ඇත.

මනස්තාපයේ අරුත එයයි. ස්වර්ගයේ දෙවියන්වහන්සේ සමග සබඳතාවයක් සඳහා එය ඔවුන් ගෙනෙන අතර අවසානයේදී විශ්වාසවන්ත සේවය සඳහා සදාකාලික ජීවිතයේ මහත් දීමනාව ලබනු ඇත.

කෙටියෙන්, දෙවියන්වහන්සේ කෙතරම් සත්‍යද යත්, එහි විඳවීම සහ මරණය සමග මිනිස් ස්වභාවයේ මූලික යථාර්තය, උන්වහන්සේගේ සහ තමන්වහන්සේගේ පුත්‍රයාගේ සමානත්වයට වෙනස් කිරීමට උන්වහන්සේ යෝජනා කරනසේක.

මෙම දෙවියන්වහන්සේ නොසලකා හැරීමට නොහැක. උන්වහන්සේගේ වචනය විවෘතකර කියැවීමට අපේක්ෂාවෙන් සිටී. අප තවත් බලාසිටින්නේ කුමක් සඳහාද?

- ෆ්‍රෙඩ් පියර්ස් -

ප්‍රශ්න

1. බයිබලය උත්තරීතර අධිකාරීත්වය ඇති ග්‍රන්ථය වන්නේ ඇයි?

2. අප හා සාපේක්ෂකව, දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය, විභූතිය සහ ශුද්ධවූභාවය හඳුනාගැනීම වැදගත්වන්නේ ඇයි?

3. හෙබ්‍රෙව් 12:5-11 සහ රෝම 11:22 කියවන්න. එහි "දෙවියන්වහන්සේ ප්‍රේමයයි" යන්න විස්තර කරන්න.

4. දෙවියන්වහන්සේගේ ගතිලක්ෂණ විස්තර කරන්න (නික්මයාම 34:6 සහ 7 බලන්න).

5. මෙම පෘතුවිය සමග දෙවියන්වහන්සේගේ අභිප්‍රාය කුමක්ද?

6. දෙවියන්වහන්සේ ඔබ මැවූයේ ඇයි? උන්වහන්සේ ඔබගෙන් අපේක්ෂාකරන්නේ කුමක්ද?

ඔබගේ පිළිතුරු මෙම ලිපිනයට එවන්න:

: ක්‍රිස්ටඩෙල්ෆියන්ස්, තැ.පෙ.60, මීගමුව, 11500.